**උතුර කඩිනමින් යථා තත්ත්වයට පත් කිරීමේ ව්‍යාපෘතියේ (ඒයුඑස්.ඒඅයිඩී) ( ඊඑන්ආර්ඊපී ) 2012 ජූලි 31 දිනෙන් අවසන් මාස 7 ක කාල පරිච්ඡේදය**

---

1. **මතය.**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2012 ජූලි 31 දිනෙන් අවසන් මාස 7 ක කාල පරිච්ඡේදය සඳහා ව්‍යාපෘති නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2012 ජූලි 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයන ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) සමාලෝචිත මාස 7 ක කාල පරිච්ඡේදය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තා වල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2012 ජූලි 31 උනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ප්‍රදාන ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ප්‍රදාන ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2. මූල්‍ය ප්‍රකාශන.

### 2.1 මූල්‍ය කාර්ය සාධනය.

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2012 ජූලි 31 දිනෙන් අවසන් මාස 7 ක කාල පරිච්ඡේදය සඳහා ව්‍යාපෘතියේ වියදම රු.7,399,560 ක් වූ අතර 2012 ජූලි 31 දිනට සමුච්චිත වියදම රු.1,172,825,228 ක් විය. සමාලෝචිත කාල පරිච්ඡේදය සඳහා වියදම ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2012 ජූලි 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් විෂයය | 2012 ජූලි 31 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා වියදම | 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | 2012 ජූලි 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ආ - කොටස | | | |
| කාර්ය ගාස්තු ( වැඩ සඳහා මුදල් ) | 7,399,560 | 319,695,607 | 1,172,825,228 |
| එකතුව | 7,399,560 | 319,695,607 | 1,172,825,228 |

### 2.2 අග්‍රිම අරමුදල් ගිණුම

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව සමාලෝචිත මාස 7 ක කාල පරිච්ඡේදය සඳහා අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් හා 2012 ජූලි 31 දිනට ශේෂය පහත දැක්වේ.

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 170,908 | 19,466,687 |
| එකතු කළා :- | | |
| ඌන පූර්ණයන් | 111,577 | 15,343 |
| විදේශ විනිමය අවාසිය | - | (15,565) |
| | 282,485 | 19,466,465 |
| අඩුකළා :- ආපසු ගැනීම් | 282,485 | 19,466,465 |
| | නැත | නැත |

## 3. විගණන නිරීක්ෂණ

### 3.1 වාර්ෂික කාර්ය සැලැස්ම හා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත කාල පරිච්ඡේදය සඳහා කාර්ය සැලැස්මක් පිළියෙල කර නොතිබුනි.

(ආ) සමාලෝචිත මාස 7 ක කාල පරිච්ඡේදය සඳහා කාලීන කාර්ය සාධන වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.2 අරමුදල් උපයෝජනය

1 වර්ගය යටතේ භාණ්ඩ හා උපදේශක සේවා සඳහා ප්‍රදාන ගිවිසුමේ ප්‍රතිපාදන සලසා තිබුණද ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ වියදම් කිසිවක් දරා නොතිබුණි. එහෙත් 2 වර්ගය යටතේ පහත විස්තර දැක්වෙන පරිදි ප්‍රතිපාදනය ඉක්මවා වියදම් දරා තිබුණි.

| වර්ගය | ප්‍රතිපාදනය කරන ලද ප්‍රදාන | | වියදම | ඉක්මවූ වියදම | |
|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. | ශ්‍රී.ලං.රු. | ශ්‍රී.ලං.රු. | ශ්‍රී.ලං.රු. | % |
| කාර්ය ගාස්තු වැඩ සටහන සඳහා භාණ්ඩ හා උපදේශක සේවා | 2,634,767 | 296,249,943 | නැත | නැත | නැත |
| කාර්ය ගාස්තු වැඩ සටහන සඳහා කරන ලද ගෙවීම් | 7,904,303 | 888,750,057 | 1,172,825,228 | 284,075,171 | 32 |
| | 10,539,070 | 1,185,000,000 | 1,172,825,128 | 284,075,171 | |

### 3.3 ව්‍යාපෘති අධීක්ෂණය , වාර්තාකරණය හා ඇගයීම

ප්‍රදාන ගිවිසුමේ 1 ව්‍යවස්ථාවේ 2.05 වගන්තියෙහි සඳහන් පරිදි කාර්ය ගාස්තු මුදල් පිළිබඳ ප්‍රමාණවත් හා ක්‍රමානුකුල ව්‍යාපෘති අධීක්ෂණ , වාර්තාකරණ හා ඇගයීම් ක්‍රම සිදුකර නොතිබුණි.

**4. පද්ධති හා පාලන**

--------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) අධීක්ෂණය හා ඇගයීම